**තේ පර්යේෂණ මණ්ඩලය - 2017**

**-----------------------------------**

තේ පර්යේෂණ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 54,850,144 ක්වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතියේ 72 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකින් වෙන් කළ හැකි වත්කම් වන අතර ඒවා වෙන් වෙන්ව වර්ගීකරණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන පිරිවැය රු. 232,273,791 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් එලෙස වර්ගීකරණය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව යම් නිශ්චිත ගනුදෙනුවක්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට කටයුතු කළයුතු අතර, ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළයුතු වුවත්, මණ්ඩලය විසින් පහත සඳහන් ගනුදෙනු ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළියෙල කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.2,404,163 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.132,362,100 ක් වූ තේ වගාව මේරු, නොමේරු වශයෙන් වර්ග කර වෙන් වෙන්ව හඳුනා ගැනීම හා එම තේ වගාවන් හි ජීව තත්ත්වයන් පිළිබඳ සලකා ගිණුම්ගත කිරීම.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් දැරීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.42,973,544 ක් ආදායමට ගෙන තිබුණද ඒ සඳහා දැරූ වියදම රු. 42,701,640 ක් බැවින් රු.271,904 ක් වැඩිපුර ආදායමට ගැනීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මණ්ඩලයේ ඌනතාවය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) තේ කම්හල්වල වර්ෂය තුළදී නොවිකුණූ නිමි තේ, අවසන් තොගය ලෙස ගිණුම් වලින් අනාවරණය කරනු වෙනුවට ණයට විකුණුම් ලෙස සලකා ගිණුම් ගත කර තිබූ බැවින් වර්ෂයේ තේ විකුණුම් ආදායම හා ණයගැති ශේෂය රු.6,201,289 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මැණික් ගැරීම සඳහා වෙන්දේසි කිරීමට සමාලෝචිත වර්ෂයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ශාන්ත ජෝකිම් වතුයායේ ඉඩම් නිදහස් කර තිබූ අතර ඒ වෙනුවෙන් අධිකාරියෙන් මණ්ඩලය වෙත ලැබිය යුතු රු.239,591 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි. තවද එම ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු අනාවරණය කරද නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකර දායකය ගණනය නොකිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලය හා කම්කරුවන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකළ රු.37,316,860 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රේෂණය කිරීමේදී පෙර වර්ෂ ගැලපීම් ලෙස සටහන් නොකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් ලැමීලියා තේ කම්හලේ යන්ත්‍ර සූත්‍ර 2003 වර්ෂයේදී රු.1,010,100 කට අපහරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එම යන්ත්‍ර වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඊ) මණ්ඩලයට අයත් ඉඩම්වල ජීව විද්‍යාත්මක වත්කම් ලෙස, ශාක 5654 ක් හඳුනාගෙන ඇතත් වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(උ) මණ්ඩලයට අයත් බස් රථයක ආසන අලුත්වැඩියාව සඳහා වැයකරන ලද රු.287,200ක් හා එම රථය සඳහා අමතර කොටස් මිලදී ගැනීමට වැයකරනලද රු.252,126 ක් වියදම් ලෙස ගිණුම්ගත නොකර ප්‍රාග්ධනීත ගත කර තිබුණි.

(ඌ) ශාන්ත ජෝකිම් තේ කම්හලේ වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට නොවිකුණූ නිමි තේ තොග වටිනාකම රු. 12,866,373 ක් වුවද රු. 2,246,711 ක් ලෙස ගිණුම පිළියෙල කරන දිනට පැවති භෞතික තොග වටිනාකමට ගිණුම්ගතකර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ශාන්ත කුම්බස් තේ කම්හලේ ගිණුම් අනුව රු. 1,805,780 ක් තේ මණ්ඩලයෙන් අයවිය යුතු වුවද තේ මණ්ඩලයේ ගිණුම් අනුව ගෙවිය යුතු ශේෂය රු.1,114,630 ක් බැවින් රු.691,150 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන්වලට අදාලව, ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| කාර්ය මණ්ඩල ණය | 40,334 | විස්තරාත්මක උපලේඛන/ ශේෂ සනාථ කිරීම් |
| ණයහිමියෝ | 532,872 | විස්තරාත්මක උපලේඛන/ ශේෂ සනාථ කිරීම් |
| කුඩා තේවතු සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ශේෂ | 649,681 | සනාථ කිරීම් ලියවිලි |

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,195,377 ක් වූ විවිධ ණයගැතියන්ගෙන් රු.1,157,574 ක් වසර 05 ඉක්මවා තිබුණු නමුත් එම ශේෂ අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ශාන්ත කුම්බස් තේ වතුයායේ ගිණුම්හි ඇතුලත් සේවකයින්ගෙන් අයවිය යුතු වර්ෂ 5 ඉක්ම වූ ණය සහ අත්තිකාරම් රු.2,303,788 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික පදනමට වුවත් මණ්ඩලයේ නේවාසික ඉංජිනේරු තනතුර, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර සහ අංශ ප්‍රධානී තනතුරු 04ක් සඳහා වර්ෂ 3 සිට වර්ෂ 7 දක්වා වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් කර තිබුණි. පසුගිය වසර 07 තුල එම නිලධාරීන් වෙත මණ්ඩලය විසින් වැඩ බැලීමේ දීමනා ලෙස රු.3,722,297 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මානව සම්පත් කළමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2014/පුස/1/2016 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛයේ 3.1 ඡේදය | 1978 වර්ෂයේ සිට මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලයේ පොත් පිළිබඳ භෞතික පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. තවද පසුගිය වසර 32 ක කාලය තුල (1985 – 2017) බැහැර ගෙන යනු ලැබූ පොත් වලින් පොත් 62ක් ආපසු භාර දී නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කිසියම් මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ලැබූ නිලධාරීන් 11 දෙනෙකුට ඉතිරි විවේක නිවාඩු වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු. 419,086 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,831,737ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,372,746 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.541,009 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වියදම රු.94,965,000 කින් වැඩි වුවද ආදායම රු.95,485,000 කින් වැඩිවීම නිසා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව ඌනතාවයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 163,722,445 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2017 වර්ෂයේදී රු. 283,946,726 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා පිටරට ගොස් නැවත දිවයිනට නොපැමිණි නිලධාරීන් 05 දෙනෙකු විසින් රු.18,552,991 ක් වූ බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් වසර 7 කට පෙර සිට නඩු පවරා තිබූ අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විභාග වෙමින් පැවතුණි.

(ආ) බාහිර පාර්ශවයක් විසින් මණ්ඩලය තෙවන විත්තිකරු ලෙස සඳහන් කරමින් ඉඩම් කොටස් අත්පත් කරගැනීම සඳහා 2012 වර්ෂයේදී ද, මණ්ඩලයේ සේවකයකු විසින් කලින් දැරූ තනතුරට නැවත සේවය ලබා ගැනීම සඳහා 2015 වර්ෂයේදී ද මණ්ඩලයට එරෙහිව නඩු දෙකක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

-----------------------------------

තේ පර්යේෂණ මණ්ඩලයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් කාර්යසාධන ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

(අ) 2013-2017 වර්ෂයන්ට අදාල සංයුක්ත සැලැස්ම අනුව ඉටුකිරීමට අපේක්ෂිත වූ පර්යේෂණ 185 ක් විය. ඉන් භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වූ ප්‍රදානයන්ගෙන් රු.12,472,481ක් වැයකරමින් ආරම්භ කරන ලද පර්යේෂණ 12 ක් අතරමඟ නවතා දමා තිබූ අතර රු.24,350,677ක් වැය කරමින් ආරම්භ කරන ලද පර්යේෂණ 15 ක් කල්දමා තිබුණි. කෙසේ වුවද මෙම පර්යේෂණයන් අත්හැරීම හෝ කල්දැමීම සිදුවී වසර 3ක් පමණ ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් නැවත ආරම්භ කිරීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ජීව රසායන අංශය විසින් පර්යේෂණ නිමකර තිබුණු එකතු කළ වටිනාකම මත තේ නිෂ්පාදන 10ක් (Tea wine, instant black tea, carbonated tea, scented tea, instant milk tea, tea sauce, tea baby soap, tea seed oil, tea protein catching extract) වාණිජකරණය සඳහා වැඩිදියුණු කිරීම වෙනුවෙන් වූ ප්‍රචාරණය, පේටන්ට් බලපත්‍ර ලබාගැනීම වැනි ඉදිරි කටයුතු සිදුකර නොතිබීම නිසා එම පර්යේෂණයන්හි ප්‍රතිඵල ක්ෂේත්‍රයට යෑම සිදු වී නොතිබුණි.

(ඇ) තේ ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටළු වන තේ වගාවේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම, භූමි ඵලදායීතාවය වර්ධනය කර ගැනීම වැනි කරුණු සඳහා පර්යේෂණ සිදුකර තිබුණද එම ගැටළු සඳහා 2018 අගෝස්තු 31 දින වනවිටත් මණ්ඩලය මඟින් විසඳුම් ලැබී නොතිබුණි.

(ඈ) උපදෙස් හා ව්‍යාප්ති අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන නව තේ වගා ප්‍රභේදයන්ගෙන් යුතු රිකිලි සැපයීම සඳහා සිදුකරන ලද මවු ශාක වැඩසටහන මඟින් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂිකව බෙදාහැරීමට ඇස්තමේන්තුගත රිකිලි ප්‍රමාණයෙන් බෙදාදී තිබූ රිකිලි ප්‍රමාණය පිළිවෙලින් සියයට 58 ත් 59 ක් හා 55 ක් වූයෙන් මෙම වැඩසටහනෙහි ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන ශාන්ත කූම්බ්ස් සහ ශාන්ත ජෝකීම් වතුයායන් හා කම්හල් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ ශාන්ත කූම්බ්ස් සහ ශාන්ත ජෝකිම් යන තේ කර්මාන්තශාලා දෙකෙහි ශ්‍රම ඵලදායීතාවය, දර භාවිතය හා විදුලි ඒකකයන්හි ඵලදායීතාව අපේක්ෂිත මට්ටමට ළඟාවී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය පිළිවෙලින් තේ කිලෝග්‍රැමයකට රු. 569ක් හා රු. 603ක් වුවද පසුගිය වර්ෂයේ එය රු.509 ක් හා රු.487ක් බැවින් නිෂ්පාදන පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ශාන්ත ජෝකීම් කර්මාන්තශාලාවේ තේ නිමවුම් අනුපාතය සියයට 20.92 බැවින් සියයට 21.5ක් වන ප්‍රශස්ත නිමවුම් මට්ටම පවත්වා ගැනීමට අපොහොසත් වීතිබුණි.

(iii) ශාන්ත ජෝකිම් තේ කම්හලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත අමු තේ දළු යෙදවීම කිලෝග්‍රෑම් 1,824,740 ක් වූ අතර තථ්‍ය යෙදවීම කිලෝග්‍රෑම් 1,242,696 ක් වූයෙන් අහිතකර විචලනය සියයට 32 ක් විය. එම නිසා ඊට අනුරූපීව නිමිතේ ප්‍රමාණය අඩු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ශාන්ත ජෝකිම් වතුයායේ තේ දළු ඵලදායීත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පහත වැටී තිබූ බැවින් තේ වගාව තුලින් රු.3,028,252 ක පාඩු ලබා තිබුණි. තවද එම වතුයායේ රබර් විකිණීමෙන් ලද ආදායම රු.2,556,840ක් වුවද වියදම රු.2,620,973ක් බැවින් පිරිවැය ආවරණය කිරීමට ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි.

(v) පසුගිය වර්ෂයේ රු. 62,807 ක ආදායමක් ඉපයූ ශාන්ත ජෝකිම් වතුයායේ පැල තවාන සමාලෝචිත වර්ෂයේ රු.828,787 ක ආදායම ඉක්මවූ පිරිවැයක් දරා තිබුණි. තවාන් පාලනය නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යම් කාර්යයක් සඳහා බාහිර ආයතනයක් වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කිරීමට පූර්වයෙන් අදාල කාර්යය ඉටුකිරීමට ශක්‍යතාවයක් පවතීද යන්න සනාථ කරගත යුතු වුවත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2011 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය කාර්යාලය සඳහා ජල ආශ්‍රැත ඒකකයක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයකට රු.110,124 ක අත්තිකාරම් ලබාදී තිබුණි. කෙසේවුවද එම ආයතනය වසා දමා ඇති බවට හඳුනාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අත්තිකාරම් මුදල අයකරගෙන නොතිබුණි.

(ආ) ශාන්ත ජෝකිම් වතුයායට අයත් හෙක්ටයාර් 8.74 ක් වූ කුඹුරු ඉඩම් දිගු කාලයක සිට අඳගොවීන් විසින් වගාකරනු ලබන අතර ඉන් මණ්ඩලයට අයවිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කම් යටතේ ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO) සහතිකය ලෙස රු.2,382,613 ක් දක්වා තිබුණද එය 2014 වර්ෂයේ සිට කල් ඉකුත් වී තිබූ අතර එම අගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ දෙනියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාලයන් පිහිටි ඉඩම්වල හා තේ පර්යේෂණ මණ්ඩලයේ දක්ෂිණ මධ්‍යස්ථානය ඉදිකර තිබූ ඉඩමේ අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමට 2018 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 4.3 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේ වාර්තාව අනුව ශාන්ත කූම්බ්ස් තේ කම්හලේ දේශීය තේ අලෙවිහලේ තේ විකුණුම් මුදල් බැංකුගත කිරීම සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලෙවිසැලේ භාරකරු විසින් රු.8,085,212 ක මුදල් අක්‍රමිකතාවයක් සිදුකර ඇති බව අනාවරණය වී තිබුණි.

## 4.4 අරමුදල් උපයෝජනය

තේ නැවත වගාව සඳහා ඉකුත් වර්ෂයේදී තේ මණ්ඩලයෙන් ලැබී තිබුණු රු.359,975 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු නිල නිවාස අතරින් 'ඩී' කාණ්ඩයේ නිල නිවාස 13 ක් හා 'සී' කාණ්ඩයේ නිල නිවාස 1 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතිණි.

(ආ) ශාන්ත කුම්බස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ යන්ත්‍ර ධාරිතාවය දිනකට පිළිවෙලින් අමු තේ දළු කිලෝ ග්‍රෑම් 8,000 ක් හා කිලෝ ග්‍රෑම් 15,000 ක් විය. එසේ වුවද එම යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 5,000 ක් සහ කිලෝ ග්‍රෑම් 6,253 ක් වූයෙන් එම යන්ත්‍ර ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) ශාන්ත ජෝකිම් කම්හලේ දර භාවිතයෙන් තේ දළු වියලන යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීම හේතුවෙන් ඉන්ධන භාවිතයෙන් තේ දළු වියලන යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. තවද එම කම්හලේ පැවති ස්ටේක්ස් එස්ට්‍රැක්ටරය යන්ත්‍රය ද වසර 04 ක සිට භාවිතයට ගෙන නොතිබුණි.

(ඈ) තේ සැකසුම් කිරීම සඳහා ආයතනය විසින් 1982 වර්ෂයේදී රු.4,142,173 ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාල ව්‍යාපෘතිය සඳහා යොදාගෙන නොතිබුණු අතර වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 443 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 257 ක් වීමෙන් තනතුරු 186 ක් පුරප්පාඩු වී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක නොවන මට්ටමේ තනතුරු 94 ක් පුරප්පාඩුව පැවති අතර ඊට ඇතුළත් පර්යේෂණ හා සංවර්ධන තාක්ෂණ නිලධාරින්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ තනතුරු පිළිවෙලින් 26 ක් සහ 18 ක් පුරප්පාඩුව පැවතීම මණ්ඩලයේ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු සැලසුම් අනුව ඉටු කිරීමට බාධාවක් වී තිබුණි.

(ආ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ ස්ථාන භාර නිලධාරී (ඕ.අයි.සී) තනතුර සඳහා නිලධාරීන් 06 දෙනෙකු, වැඩ බැලීමේ පදනම මත බඳවාගෙන දීමනා ලෙස 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 1,241,371 ක් ගෙවා තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවා ගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටි සේවකයින් 112 දෙනෙකුට (ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 105 ක් හා කළමනාකරණ සහකාර තනතුරු 07ක් ) 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබා දී තිබුණද මෙම තනතුරු ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර නොතිබුණි.

## 4.7 වාහන පාලනය

සමාලෝචිත වර්ෂයේදී රු.404,965ක් වැයකර මණ්ඩලය සතු ලොරිරථයේ එන්ජිම සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර තිබූ අතර එම කාර්යයෙන් පසු කිලෝමීටර 5000 ක ධාවන පදම් කාලයක් ගතකලයුතු නමුත් කිලෝමීටර 3237ක් පමණක් ධාවනයකර භාවිතයෙන් ඉවත්කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂිකව අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 සැප්තැම්බර් 06 දිනැති අංක 19 දරන ප්‍රසම්පාදන අතිරේකය ප්‍රකාරව රු.200,000 ක් ඉක්මවන වාහන අළුත්වැඩියාවන් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගතයුතු නමුත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද රු.2,235,424ක් වූ අළුත්වැඩියා 05ක් සඳහා ඒ අනුව කටයුතුකර නොතිබුණි.

## 6.2 අයවැය පාලනය

අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 11 සිට සියයට 741 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

මණ්ඩලය විසින් ඒ ඒ විෂයයන්ට අදාල චක්‍රලේඛ නියමයන් හා අනෙකුත් සමාන ආයතන අභිබවා කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන නිවාඩු, නිලනිවාස හා ඒවායේ පරිභෝජනය කරනු ලබන ජලය, විදුලිය වෙනුවෙන් ගාස්තු අය නොකිරීම වැනි වරප්‍රසාද සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | වත්කම් පාලනය | වාහන අයිතිය පවරාගැනීමට කටයුතු නොකිරීම හා අළුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොකිරීම. |
| (ඇ) | පොත් පත් ලේඛන පවත්වා ගැනීම | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම, කුවිතාන්සි පොත් සම්බන්ධව ජී.ඒ. ඇන් 20 ප්‍රකාරව ලේඛනයක් නඩත්තු නොකිරීම, සුරක්ෂිත භාරයේ තැන්පත් කරනු ලබන ද්‍රව්‍ය පිලිබඳ ලේඛන හා වාර්තා නඩත්තු නොකිරීම. |
| (ඈ) | පර්යේෂණ කටයුතු | පර්යේෂණ කටයුතු නිසි පරිදි කළමනාකරණය නොකිරීම හා අවසන් කරන ලද පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ක්ෂේත්‍රයට ලබා නොදීම. |
| (ඉ) | මෙහෙයුම් පාලනය | රබර් හා පොල් වතුවල ඇති ගස් ප්‍රමාණය ගණනය කර ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |